කවරයේ කතාව

# නිවැරදි ඖෂධ භාවිතය

අපි අද නිවැරදිව වෙළඳසැලකින් ඖෂධ ලබාගන්නේ කෙසේ ද යන්න සාකච්ඡාකර බලමු. ඒ සමගම නිවැරදිව ඖෂධ භාවිතය ගැන ද කෙටියෙන් පැහැදිලි කර ගනිමු. අපි බොහෝ වේලාවට රෝගීන් වෛද්‍යවරයාට පෙන්වීමට දක්වන උනන්දුව, වෛද්‍යවරයා ලබාදෙන තුන්ඩුවේ ඇති ඖෂධ ලබාගැනීමට දක්වන්නේ නැහැ. මේ කාරණය ඖෂධවේදීන් හැටියට අප බහුලව දකින කරුණකි.

රෝගියා වෛද්‍යවරයාට පෙන්වනවා සේම නිවැරදිව ඖෂධ ලබාගැනීමත් වැදගත් කරුණකි. අද ලංකාවේ වෙළඳසැල් වලින් ඖෂධ නිකුත් කිරීම ඖෂධවේදීන් මගින් හා ඖෂධවේදීන්ගේ අධීක්ෂණය යටතේ පුහුණුවන ඖෂධවේදීන් මගින් සිදු කෙරේ. අපට පවුලේ වෛද්‍යවරයාගෙන් හෝ විශේෂඥ වෛද්‍යවරයෙකු විසින් ලබා දෙන ඖෂධ වට්ටෝරුවේ අඩංගු කරුණු කෙටියෙන් සලකා බලමු. පළමුව තමාගේ නම, වයස, ගැහැණු, පිරිමි බව හා දිනය ආදී කරුණු අඩංගුවේ. ඉන්පසුව පිළිවෙලින් ලබාදෙන ඖෂධ වල නම, සැර ප්‍රමාණය, මාත්‍රාව, සහ පාවිච්චි කළයුතු කාලය කොපමණද යන්න සඳහන් වේ. අවසානයේ වෛද්‍යවරයාගේ සුදුසුකම් සහිත මුද්‍රාව සහ අත්සන සඳහන් වේ. අවසාන කොටසේ ඇති වැදගත්කම වන්නේ ඖෂධවේදියාට වෛද්‍යවරයාගේ අනන්‍යතාව පැහැදිලිව පරීක්ෂා කරගත හැකිය. එම කාරණය රෝගියාට ද ඉතා වැදගත් වේ. හේතුව සුදුසුකම් නැති වෛද්‍යවරු හැටියට පෙනී සිටින පුද්ගලයන් දිවයින පුරාම සිටින නිසාය.

01. මුලින්ම නිවැරදි වට්ටෝරුව ඖෂධ වෙළඳ සැලට ඉදිරිපත් කරන්න.
02. සම්පූර්ණ බෙහෙත් වට්ටෝරුවට යන වියදම හා ඖෂධ වර්ග කීපයක්ද වන වග.
03. ඖෂධ කොපමණ කාලයක් ගතයුතු ද යන්න දැනගන්න. හේතුව බොහෝ විට රෝගීන් කාලය ඉක්මවා ඖෂධ භාවිතා කිරීම නිසා අතුරු ආබාධ ඇති කිරීමට හේතුවනවාසේම රෝගී තත්ත්වයන් ද එමගින් ඇතිවිය හැක.
04. තමාට ඖෂධ ලැබුණ පසුව වට්ටෝරුවට අදළ ඖෂධ ලැබුනේද යන්න පිළිබඳව සොයා බැලිය යුතුය.
05. ලැබුණ ඖෂධ වෙන වෙනම අසුරා තිබේද යන්නත් භාවිතා කරන ආකාරය පැහැදිලිව ලියා තිබේද යන්නත් බලන්න.

මීට අමතරව ඔබට ඖෂධ භාවිතයේ දී ඇතිවන දැනෙන අතුරු ආබාධ පිළිබඳ දැනීමක් නැතිනම් ඖෂධවේදියාගෙන් ඒ පිළිබඳව අසා දැනගත යුතුය. මෙය බොහෝවිට රෝගීන් මගහැරයන කරුණකි. හේතුව හැකි ඉක්මනින් ඖෂධ රැගෙන යාමට පුරුදුව සිටීමයි.

නිවසට ගොස් ඖෂධ පාවිච්චි කරන විට අතුරු අබාධයක් ඇතිවූ විට ඒ ගැන නොදන්නා කමින් කලබලයට පත්වේ. ඒ සමගම ලබාගන්නා ප්‍රතිකාරය අතරමග නතර කරයි. එබැවින් ඒ පිළිබඳ කල්තියා විමසා දැනගැනීමෙන් ඖෂධ භාවිතයේ දී මහත් පිටුවහලක් ලැබේ.

උදාහරණයක් ලෙස ඇදුමට ගන්නා SALBUTAMOL නැමැති ඖෂධය නිසා ඇතැම් රෝගීන්ට ඇඟිලිවල වෙව්ලීමක් ඇතිවේ. මෙය රෝගියාට දැනෙන අතුරු ආබාධයකි. යකඩ අඩංගු සිරප් හා පෙති නිසා මල ද්‍රව්‍ය කද කළු පැහැයක් ඇතිවන අතර, මල බද්ධය ද අතුරු ආබාධයක් හැටියට ඇතිවේ. මෙවැනි කරුණු බෙහෙත් පාවිච්චි කරණ විට රෝගියා දැනසිටිය යුතුවේ. එබැවින්, අතුරු ආබාධ ගැන දැනගැනීම රෝගියාගේ අයිතිවාසිකමක් වේ.

නිවසට ගිය පසු මෙම ඖෂධ වෙනම සුදුසු ස්ථානයක තැබිය යුතුය. හේතුව කුඩා ළමුන්ට එම ඖෂධ අතට අසුවීමෙන් ඇතිවන භයානක තත්ත්වයන්ගෙන් වැලකීමට පියවරක් වශයෙනි. ඖෂධ කිපයක් වට්ටෝරුවේ ඇත්නම් එම ඖෂධ වෙන වෙනම එකට නොගැවෙන පරිදි අසුරා තබාගත යුතුය. හේතුව එම ඖෂධ අතර අන්තර් ප්‍රතික්‍රියා ඇතිවී ඒවා වෙනත් විෂ සහිත රසායනික බවට පත්විය හැකිය. එවිට ඒවා මගින් භයානක අතුරු ආබාධ ඇතිවේ.

දීර්ඝ කාලයක් ඖෂධ ගන්නා රෝගියෙක් නම් ඖෂධ හොඳින් අසුරාතබා ගත යුතුය. හේතුව ඖෂධ ඖෂධ වශයෙන් පවතින්නේ එයට අදල නියම තත්ත්වයන් යටතේ පමණි. ඒවායේ රසායනික ගුණයට පාරිසරික සාධක අහිතකර ලෙස බලපෑවිට ඖෂධ වෙනත් රසායනිකයක් බවට හැරේ. එවිට එහි ඖෂධීය ගුණය නැතිවී ගොස් වෙනත් විෂ සහිත රසායනිකයක් බවට හැරේ.

උදා: හෘද රෝගීන් නිතර ගන්නා ඇස්ප්‍රින් (ASPRIN) නමැති ඖෂධ ය පරිසරයේ ඇති ජලවාෂ්ප නිසා වෙනත් රසායනිකයන් දෙකක් බවට පත්වේ. එබැවින් ආමාශ ගතවීම ඉක්මන්වේ. අනෙක එතැන ඇස්ප්‍රින් (ASPRIN) වල ගුණය ද නැත. එමනිසා සෑම ඖෂධයක්ම නියමිත පරිදි අසුරා තැබිය යුතුය. ඖෂධ වලට බලපාන පාරිසරික සාධක වන්නේ

**කෙළින්ම වැටෙන හිරු එළිය**
**වාතයේ ඇති ජලවාෂ්ප**
**වාතයේ ඇති ඔක්සිජන් හා**
**කාබන්ඩයොක්සයිඩ්**

ඉහත දක්වූ සාධක වලින් අප ඖෂධ ආරක්ෂාකර ගෙන භාවිතා කළ යුතුය. කිසිම අවස්ථාවකදී හෝ නෙත ඇඟිවලින් බෙහෙත් ස්පර්ශ නොකළ යුතුය.

තවත් වැදගත් කාරණයක් වන්නේ දියවැඩියාව, ඇදුම, අධික රුධිර පීඩනය හා අපස්මාර ය වැනි රෝගවලට ඖෂධ ගන්නා රෝගීන් එම ඖෂධවල ඖෂධීය නාමය දැන සිටිය යුතුය. කිසිදු අවස්ථාවකදී හෝ ඉහත රෝගීන් බෙහෙත් වට්ටෝරුව නොමැතිව වෙළඳසැල් වලින් ඖෂධ ලබා නොගත යුතුය. ඖෂධ සඳහා භාවිතා කරන නාමයෙහි එක් අකුරක හෝ එහා මෙහාවීමක් සිදුවුවහොත්, ලැබෙන්නේ වෙනත් බෙහෙතක් වීම නිසාය. එසේම වට්ටෝරුවක් නොමැතිව බෙහෙත් ලබාගැනීම නීතිවිරෝධී ක්‍රියාවකි.

ඉහත රෝගීන්ට වෛද්‍යවරු බොහෝවිට ඖෂධ නිකුත් කරනුයේ කීපවරක් මාසිකව ලබාගත හැකි ආකාරයටමය. එම වාර ගණන වෛද්‍යවරයා පැහැදිලිව සටහන් කළ යුතුය. නැතිනම් වෛද්‍යවරයා ලවා වාරගණන පැහැදිලිව ලියාගත යුතුය. කිසිදු අවස්ථාවකදී වත් වෙනත් කෙනෙකු ලවා ඖෂධ ගෙන්වා ගැනීම නොකළ යුතුය. අදාල රෝගියා හෝ තමන්ගේ කිට්ටු ඥාතියෙකු ඒ සඳහා යැවිය යුතුය.

පාවිච්චි නොකර ඉතිරිවන ඖෂධ නමුන්ගේ ගෙදර වත්තේ කොනක වලක් කපා වළ දැමිය යුතුය. ❑

තුෂාන්ත ප්‍රේමවර්ධන